පර්යේෂණ ක්ෂේත්‍රයේ 80 වසරක අභිමානය
80 வருட ஆய்வின் சாதனை
80 Years of Research Achievement

# තේ තතු

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි

ISSN - 1391- 6785

## නිවැරදි කාණු පද්ධතියක් යොදා සෝදා පාළුව අවම කරමු

තේ නැවත වගාව සඳහා බිම් සැකසීමේදී පස් සෝදා පාළුව අවම කිරීමට හැකි සෑම පියවරක්ම ගැනීම ඉතාම වැදගත් කාරණයක් වෙනව. අපි කොපමණ රසායනික පොහොර යෙදූවත් කාබනික කොටස් අඩංගු මතුපිට සරු පස් තට්ටුවක් නොමැති නම් එම යොදන පොහොර වලින් උපරිම ඵල ලබා නොගත හැකි බව පර්යේෂණ වලින් තහවුරු වී තිබෙනවා.

සෝදා පාළුව අවම කර ගැනීමට


A රාමුව


රොන් මඩ වලවල් සහිත කාණු

හා වැසි ජලයෙන් උපරිම ඵල ප්‍රයෝජන ලැබීමට හොඳ කාණු පද්ධතියක් ස්ථාපනය කිරීම ඉතාම වැදගත්. බෑවුම් සහිත අපේ තේ ඉඩම් වල එකතු වන වැඩිපුර වර්ෂා ජලය ඉන් ඉවතට ගෙන යාමට අප නෙත්ති කාණු යොදා ගන්නවා. සාමාන්‍යයෙන් නෙත්ති කාණු ඉදි කරන්නේ ස්වභාවිකව ජලය ඉහල සිට පහලට ගලා යන අගල් දිගේය. දෙපසින් යොදන සමෝච්ච කාණු වලින් නෙත්ති කාණු වලට අධික ජල ප්‍රමාණයක් එකතු වන නිසා නෙත්ති කාණු ගල් යොදා ගනිමින් ශක්තිමත්ව බැඳ ගැනීම ඉතා වැදගත්. ඒ වාගේම නෙත්ති කාණු ඉහල සිට පහලට පඩි පෙල් ආකාරයට (පඩියේ මතුපිට බෑවුම පිටුපසට සිටින සේ) බැඳ ගත යුතුය. කුට්ටි කාණු සමෝච්ජ ආකාරයට අඩි 120 ට අඩියක බෑවුමක් සිටින සේ සකස් කර ගත යුතුය. මෙම බෑවුම මැන ගැනීමට 'A' රාමුව භාවිතා කරන්න පුළුවන්. එසේම පැල පේලි ලකුණු කිරීමටද 'A' රාමුව භාවිතා කල හැකියි. නෙත්ති කාණු වල පතුල රූපයේ දැක්වෙන ආකාරයට කුට්ටි කාණු ලෙසින් හෝ රොන් මඩ වලවල් සහිතව සාදා ගැනීමෙන්, සෝදා පාළුවට ලක්වී ඉවත් වන පස් සහ රොන් මඩ ඉඩම තුලම රැස් කර ගත හැකිවෙනවා. කුට්ටි කාණු දෙකක් අතර පරතරය ඉඩමේ බෑවුම අනුව වෙනස් වෙනවා. ඒ අනුව අඩි 20 සිට අඩි 40 ක පරතර වලින් ඒවා සකස් කර ගැනීම ප්‍රමාණවත්. මෙම කාණු නෙත්ති කාණුවක දෙපසින් එකම ස්ථානයකදී එකතු නොවිය යුතුයි. කාණු වල එකතු වන රොන් මඩ නැවත ක්ෂේත්‍රයටම එකතු කර ගත හැකි නිසා ක්ෂේත්‍රයේ ඇති සරු මතුපිට පස් තට්ටුව එහිම රඳවා ගත හැකි වෙනවා. ඒ වාගේම නෙත්ති කාණු වල ඉහල ඉවුරේ සැවැන්දරා වැනි තෘණ වර්ගයක් සිටුවා කාණු ගැට් ශක්තිමත් කර තව දුරටත් පස් සෝදා පාළුවෙන් ආරක්ෂා කර ගත හැකියි. අධික වැසි කාල වලට පසුව මෙම කාණු සුද්ද කර පිලිසකර කර ගැනීමත් ඉතා වැදගත්.

සුරංජන් ප්‍රනාන්දු